
# 23. නියමිත වේලාවට නියමිත කාර්යය ඉටු කරමු

ශිෂ්‍යයිනි! උදේට ඉර පායා සවසට බැස යනවා ඔබ දකින්නෙහි ය. අල්ලාහ්ගේ විධානය අනුව එය නියමිත වේලාවට පායා නියමිත වේලාවට බැස යයි. අප අපගේ කාර්යයන් නියමිත වේලාවට ඉටු කරනවා දකින්නට අල්ලාහ් කැමැති ය. සලාත්, සවම් වැනි නැමදුම් අල්ලාහ් පිළිගන්නේ නියමිත වෙලාවට ඉටු කළොත් පමණකි. එම නිසා නියමිත වේලාවට සලාතය ඉටු කරමු; නියමිත කාලයේ සවිමයේ යෙදෙමු. මේ අන්දමට අල් කුර්ආන් පාරායනය, පාඩම් කිරීම, නිදා ගැනීම, අවදි වීම, ක්‍රීඩා කිරීම වැනි කුමන කාර්යයක හෝ වේවා ඒවා නියමිත වේලාවට ඉටු කරමු.

දැන් කළ යුතු දේ පසු ව කරන්නෙමු; හෙට කරන්නෙමු; කියා කල් දැමීම සුදුසු නො වේ. මේ නිසා දුක සහ පාඩු ඇති වේ.

නියමිත වේලාවට නියමිත කාර්යය ඉටු කරන විට අල්ලාහ්ගේ ආදරය හිමි වේ. දෙමවුපියන්ගෙන්, ගුරුවරුන්ගෙන් සහ හිතවතුන්ගෙන් ප්‍රශංසාව ලැබේ. ජීවිතයේ ජය අත් වේ.



## පැවරුම්

**පාසල ඇරී නිවසට ගිය පසු නින්දට යන තුරු ඔබ කළ යුතු දේවල් පිළිවෙළින් අභ්‍යාස පොතේ ලියන්න.**

1. පාසල ඇරී නිවසට යාම
2.
3.
4.
5.
6.
7.
8.